සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved]

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025

## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade } 10 | විෂයය Subject } ඉතිහාසය II History II | කාලය Time } පැය 03යි 03 hours |

නම : - ................................................................ ශ්‍රේණිය :- ................................................

- පළවෙනි කොටසේ පළවෙනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- දෙවන කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුයි.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ම සපයා ඇති ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) සූකරතිත්ථ, පදවිය වැව, ලංකා පටුන, පොළොන්නරුව, මිණිපේ අමුණ, සල්වතොට, ඉබ්බන්කටුව, කැලණි ගඟ, පාහියන්ගල ලෙන, කිරිඳි ඔය, උඩරංචාමඩම, නාච්චදූව වැව (ල. 12)

(ii) රෝමය, පර්සියන් බොක්ක, මලය අර්ධද්වීපය, ඇලෙක්සැන්ඩ්‍රියාව, චීනය, කාලිංගය (ල. 6)

(ආ) පහත a, b, c, d යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

(a) චීනය සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ ලාංකික රජතුමා

(b) පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා

(c) වැවෙහි රොන්මඩ ඉවත් කිරීමට ඉදිකර ඇති අංගය

(d) නිසි කලට සී සෑම නොකරන පුද්ගලයින්ගෙන් කලං පහක දඩයක් අය කළ බව සඳහන් වන සෙල්ලිපිය (ල. 4)

(ඇ) පහත A හා B පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

(A)



(i) A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) එය දක්නට ලැබෙන ඓතිහාසික ස්ථානය නම් කරන්න.

(iii) මෙතුමා පාලනය කළ රාජධානිය කුමක් ද?

(iv) මෙතුමා සම්බන්ධතා පැවැත්වූ රට කුමක් ද? (ල. 4)

(B)



(i) B රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?

(ii) මේවා හඳුන්වන නම සඳහන් කරන්න.

(iii) මෙය නිපදවූ රට කුමක් ද?

(iv) මෙහි දක්නට ලැබෙන සංකේතයක් සඳහන් කරන්න. (ල. 4)

## II කොටස

02. (i) පහත දැක්වෙන සාහිත්‍ය කෘති අයත්වන මූලාශ්‍රය වර්ගය පිළිවෙළින් ලියන්න.
(a) තිසර සංදේශය (b) පැරකුම්බා සිරිත (c) කොන්ස්තන්තීනු සටන (ල. 3)

(ii) පහත සඳහන් විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය රචනා කළ කතුවරුන්ගේ නම් ලියන්න.
(a) එදා හෙළදිව (b) ඉන්ඩිකා
(c) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (d) බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය (ල. 4)

(iii) සෙල්ලිපි පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ල. 5)

(iv) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කරගත යුත්තේ ඇයිදැයි කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

03. (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ අවමංගල චාරිත්‍ර පැවති බවට තොරතුරු අනාවරණය වන ලෙන් තුනක් සඳහන් කරන්න. (ල. 3)

(ii) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ ඓතිහාසික ස්ථාන පිළිවෙළින් නම් කරන්න.
(a) සක්කගල් බැම්මකට අයත් කොටසක්
(b) සොහොන් ගැබක තිබී හමුවූ යබොර කැබැල්ලක්
(c) ඇස් අඳුන් ගෑමට භාවිත කළ ලෝහ කූරක්
(d) ආනයනය කළ පබළුවලින් නිම වූ පබලු මාලයක් (ල. 4)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ල. 5)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යාප්තිය සිදුවූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

04. (i) පහත සඳහන් පුද්ගලයින් පිළිබඳව සඳහන් වන සෙල්ලිපි අනුපිළිවෙළින් සඳහන් කරන්න.
(a) දූහතර රජ (b) පොචනි රජ (c) තොට බොජක (ල. 3)

(ii) (a) මෙරට රජවරුන් හැඳින්වීමට භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප දෙකක් හා
(b) අතීතයේ දී රාජ්‍ය උරුමය සිදුවූ ආකාර දෙකක් පිළිවෙළින් සඳහන් කරන්න. (ල. 4)

(iii) වැව් පද්ධතියක් ඉදිකිරීමේ අරමුණු දෙකක් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස දුටුගැමුණු රජතුමාගෙන් සිදුවූ සේවාවන් තුනක් විස්තර කරන්න. (ල. 6)

05. (i) පහත සඳහන් බදු අය කරන ලද්දේ කුමක් සඳහාදැයි පිළිවෙළින් සඳහන් කරන්න.
(a) කැති අඩ (b) දකපති (c) මතර මජිබක (ල. 3)

(ii) (A) පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධයෙන් අතීත වරායන් දෙක පිළිවෙළින් නම් කරන්න.
(a) ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවූ උතුරු වෙරළේ පිහිටි වරාය
(b) හේමමාලා සහ දන්ත කුමරුවන් දළදාව රැගෙන මෙරටට පැමිණි නැගෙනහිර වෙරළේ පිහිටි වරාය

(B) පහත සඳහන් රෝහල් කරවූ රජවරුන් පිළිවෙළින් නම් කරන්න.
(a) උපසග්ගරෝගනාසා (b) පසවන්තිනාම සාලා (ල. 4)

(iii) අතීතයේ මෙරට අධ්‍යාපනය ඉතා දියුණු මට්ටමක පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) අතීතයේ මෙරට ජීවත් වූ සියලු ජන කොටස් වාර්ගික සහජීවනයෙන් කටයුතු කළ ආකාරය කරුණු තුනක් ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 6)

06. (i) පහත දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුර පිළිවෙළින් ලියන්න.

(a) වෙර යොදා බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවාගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය

(b) මැටි පස් බොරළු කිරිමැටි ආදිය තට්ටු ලෙස යොදා ඉදිකරන ලද වැව් බැම්මක්

(c) සොරොව්වට සම්බන්ධ කර ඇති මොහොළ, මොහොල් නගා, දිය කැට පහන් යනුවෙන් සඳහන් කර ඇති සෙල්ලිපිය (ල. 3)

(ii) වැවක දක්නට ලැබෙන පහත සඳහන් අංගයන්ගෙන් සිදුවූ කාර්යයන් පිළිවෙළින් සඳහන් කරන්න.

(a) වැව් බැම්ම (b) රළපනාව

(c) පිටවාන (d) බිසෝ කොටුව (ල. 4)

(iii) මහා වැව් ඉදිකිරීමේ අරමුණු දෙකක් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) අතීතයේ මෙරට වාස්තු විද්‍යාව ඉතා දියුණු මට්ටමක පැවැති බව කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 6)

07. (i) පැරණි සමාජයේ මෙරට කාන්තාවන් ගෞරවයෙන් හා උසස් අන්දමෙන් සැලකූ බව සඳහන් වන සාහිත්‍යය මූලාශ්‍රය තුනක් නම් කරන්න. (ල. 3)

(ii) හතරවන උදය රජතුමාට අයත් හෝපිටිගමුව සෙල්ලිපියෙහි සඳහන් වන වෙළඳාම සම්බන්ධයෙන් පනවා තිබූ නීති හතරක් සඳහන් කරන්න. (ල. 4)

(iii) අතීතයේ මෙරට වැසියන් තම ආහාරය පිළිබඳව සැලකිලිමත් වූ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) පරිසරය ආරක්ෂා කර ගැනීමට මෙරට පාලකයින් නීති රීති පනවමින් කටයුතු කළ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)